# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2054/45 - 2018 ජනවාරි මස 18 වැනි බ්‍රහස්පතින්දා - 2018.01.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1978 අංක 41 නාගරික සංවර්ධන අධිකාරි පනතේ ප්‍රතිපාදන අනුව පිළියෙල කරන ලද කොළඹ නගර සංවර්ධන සැලැස්ම 2008 (සංශෝධිත) ප්‍රතිසංශෝධනය කිරීම

මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මා 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 8 ඊ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2008 කොළඹ නගර සංවර්ධන සැලැස්මේ යෝජිත සංශෝධන අනුමත කරන ලද බව වරින් වර සංශෝධිත 1978 අංක 41 8උ වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහජනතාව වෙත මෙයින් දන්වමි.

1999 කොළඹ නගර සංවර්ධන සැලැස්ම සංශෝධනය කරමින් 2008 (සංශෝධිත) කොළඹ නගර සංවර්ධන සැලැස්මේ 5 වන වගන්තියට අදාළව 2012 වසරේ සිට ක්‍රියාත්මක කරන ලද සංශෝධන 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 8 ඌ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මා මෙයින් අනුමත කරමි.

පහත ප්‍රතිපාදන ආදේශ කරමින් කොළඹ සංවර්ධන සැලැස්මේ (මින්මතු 1999 කොළඹ ප්‍රධාන සංවර්ධන සැලැස්ම සහ 2008 (සංශෝධිත) සංවර්ධන සැලැස්ම යනුවෙන් සඳහන් කරන) 5 වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

5 වන උප වගන්තියේ පළමු පරිච්ඡේදයට පසුව පහත සඳහන් නව පරිච්ඡේදය ඇතුළත් කරනු ලැබේ.

"ලෙයාර්ඩ්ස් පාරේ නැගෙනහිර දිශාවේ එම පාරට මුහුණලා පිහිටි පළමු බිම් කොටස්, එම බිම් කොටස්හි අවසානය දක්වා මිශ්‍ර සංවර්ධනය කලාපය වේ."

පාඨලී චම්පික රණවක,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2017 ජූලි මස 14 වෙනි දින.

02 - 140/1


1A - PG 3890 — 107 (2018/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## 1978 අංක 41 නාගරික සංවර්ධන අධිකාරි පනතේ ප්‍රතිපාදන අනුව පිළියෙල කරන ලද කොළඹ නගර සංවර්ධන සැලැස්ම 2008 (සංශෝධිත) ප්‍රතිසංශෝධනය කිරීම

මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මා 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 8 ඊ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2008 කොළඹ නගර සංවර්ධන සැලැස්මේ යෝජිත සංශෝධන අනුමත කරන ලද බව වරින් වර සංශෝධිත 1978 අංක 41 8උ වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහජනතාව වෙත මෙයින් දන්වමි.

1999 කොළඹ නගර සංවර්ධන සැලැස්ම සංශෝධනය කරමින් 2008 (සංශෝධිත) කොළඹ නගර සංවර්ධන සැලැස්මේ 7 වන වගන්තියට අදාළව 2012 වසරේ සිට ක්‍රියාත්මක කරන ලද සංශෝධන 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 8 ඌ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මා මෙයින් අනුමත කරමි.

පහත ප්‍රතිපාදන ආදේශ කරමින් කොළඹ සංවර්ධන සැලැස්මේ (මින්මතු 1999 කොළඹ ප්‍රධාන සංවර්ධන සැලැස්ම සහ 2008 (සංශෝධිත) සංවර්ධන සැලැස්ම යනුවෙන් සඳහන් කරන) 7 වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

අමතර රථවාහන නැවතුම් මහල් 7.30 වන උප වගන්තියේ පළමු පරිච්ඡේදය පහත ආදේශකය මගින් සංශෝධනය කරනු ලැබේ.

| *ගොඩනැගිලි (වර්ගය)* | *අමතර රථවාහන නැවතුම් මහල් ගණන* |
|---|---|
| අඩු උස | 1 |
| අතරමැදි උස | 2 |
| මධ්‍යම උස | 3 |
| අධි උස | 4 |

I. 4.1 (e) හි සඳහන් සංවර්ධනයන්ට හැර විශේෂ ප්‍රාථමික නේවාසික කලාපයේ සංවර්ධනයන් සඳහා මෙම ප්‍රතිපාදනය අදාළ නොවේ.

II. අවසරලත් ගෙබිම් අනුපාත, සම්පූර්ණ මහල් ගණන හා අනෙකුත් රෙගුලාසිමය අවශ්‍යතා සඳහා අමතර වාහන නැවතුම් මහල් සලකනු නොලැබේ.

III. රෙගුලාසිමය අවශ්‍යතා අනුව වෙන් කෙරෙන වාහන නැවතුම්වලට අතිරේකව ඇති වාහන නැවතුම් කොළඹ මහ නගර සභාවේ විශේෂ අනුමැතිය සහිතව කුලී පදනම මත වෙනත් පාර්ශ්වයකට ලබාදිය හැකිය.

IV. බහු මහල් රථ වාහන නැවතුම් ගොඩනැගිලි සඳහා ද අමතර රථ වාහන නැවතුම් මහල් සඳහා අවසර දෙනු ලැබේ.

අතරමැදි මහල් (ගොඩනැගිල්ලක මහල් දෙකක් අතර මහල)

| *වර්ගය* | *අතරමැදි (මැසනයින්) මහල් ගණන* |
|---|---|
| අඩු උස | 1 |
| අතරමැදි උස | 2 |
| මධ්‍යම උස | 3 |
| අධි උස | 4 |

i. අතරමැදි මහල් ගොඩනැගිල්ලක මුළු වර්ග ප්‍රමාණයට ගණනය කරනු ලබන අතර, එය මහල් ගණනට ඇතුළත් නොවේ.

ii. අතරමැදි මහලක ගෙබිම් ප්‍රමාණය පිහිටන මහලේ ගෙබිම් ප්‍රමාණයෙන් 50% නොඉක්මවිය යුතුය.

iii. අතරමැදි මහලක ඕනෑම ස්ථානය සිට පහලට හා ඉහළට මීටර් 2.5 කට අඩු නොවන පැහැදිලි උසක් තිබිය යුතුය.

iv. අතරමැදි මහලක සිට කිසිදු ඉහළ මහලකට සම්බන්ධතාවයක් නොතිබිය යුතුය.

v. 50% ක ගෙබිම් ප්‍රමාණය වාසයට සුදුසු ඉඩම අවකාශයට අනුකූල විය යුතුය.

vi. වාසය කරන්නන්ට හා භාණ්ඩවලට හානියක් සිදු නොවන පරිදි ගිනි ආරක්ෂණ විධික්‍රම හා ආධාරක ඉදිකිරීම වැනි රෙගුලාසි හඳුන්වා දිය යුතුය.

ස්වාභාවික වාතාශ්‍රය හා අලෝකය ලබා ගැනීමේ විවෘත අවකාශ — 7.26 උප වගන්තියේ "වා ලිඳ" යන්නට පසුව "පැති ඉඩ/පිටුපස ඉඩ" ඇතුළත් කරනු ලබන අතර, අංක 3 තීරයේ "අවම ප්‍රමාණය යන්නට පසුව "විවෘත මිදුල සහ වා ළිඳ සඳහා පමණක්" යන්න ඇතුළත කරනු ලැබේ.

රෙගුලාසිමය අවශ්‍යතා — ඇ ආකෘතිය අවලංගු කරනු ලබන අතර, ප්‍රතිශෝධිත ඇ2 ආකෘතිය ආදේශනය කරනු ලැබේ.

| ගොඩනැගිලි වර්ගය | බිම් මහල ඇතුළත්ව උපරිම මහල් ගණන | අවම ඉදිරිපස පළල (මීටර) | උපරිම ගොබිම් ආවරණය (%) | ගොඩනැගිලි අවට විවෘත ප්‍රදේශ | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | අවම පිටුපස ඉඩ (මීටර) | එක පැත්තක අවම ඉඩ (මීටර) | යෝජිත පැති ඉඩ (මීටර) | |
| | | | | | | දෙපැත්තක | හෝ එක් පැත්තක |
| අඩු උස | බිම් මහල | 6.0 | 65 | 2.3 | - | - | - |
| | 2 | 6.0 | 65 | 2.3 | - | - | - |
| | | 6.0 | 65 | 3.0 | - | - | - |
| | 4 | 6.0 | 65 | 3.0 | - | - | - |
| අතරමැදි උස | 5 | 8.0 | 65 | 3.0 | 3.0 බිම් මහල පමණි | - | - |
| | 6 | 10.0 | 65 | 4.0 | 3.0 බිම් මහල පමණි | - | - |
| | 7 | 14.0 | 65 | 4.0 | 3.0 | - | - |
| | 8 | 16.0 | 65 | 4.0 | 3.0 | - | - |
| මධ්‍යම උස | 9 | 22.0 | 65 | 4.0 | - | - | 3.0 |
| | 10 | 26.0 | 65 | 4.0 | - | 3.0 හෝ | 4.0 |
| | 11 | 30.0 | 65 | 4.0 | - | 3.0 හෝ | 4.0 |
| | 12 | 30.0 | 65 | 4.0 | - | 3.0 හෝ | 4.0 |
| අධි උස | 13 | 35.0 | 50 | 4.0 | - | 4.0 හෝ | 6.0 |
| | 14 | 35.0 | 50 | 4.0 | - | 4.0 හෝ | 6.0 |
| | 15-20 | 40.0 | 50 | 4.0 | - | 6.0 හෝ | 9.0 |
| | 21ට වැඩි | 40.0 | 50 | 4.0 | - | 6.0 හෝ | 9.0 |

මහල් පහකින් හා හයකින් සමන්විත ගොඩනැගිලි සඳහා ගිනි නිවාරණ වාහන ගමන් කළහැකි පරිදි ප්‍රමාණවත් උසකින් යුතුව පැති ඉඩකඩ සැපයිය යුතුවේ.

හෝටල්, අමුත්තන්ගේ නිවාස, නැවතුම් පළවල්, ආපන ශාලා හා භෝජනාගාර සඳහා වාහන නැවතුම් අවශ්‍යතා — 2 වන උප වගන්තියේ උප ලේඛන iii හි ඇමුණුම 11 (අ) හි අයිතම අංක vi, vii හා viii අවලංගු කරනු ලබන අතර පහත සඳහන් වගුව ආදේශනය කරනු ලැබේ.

| භාවිතය | වාහන වර්ගය (සම්මත අවම වාහන නැවතුම්) | | | |
|---|---|---|---|---|
| | වාහන නැවතුම් | මෝටර් සයිකල්/පාපැදි | ඇකසල් 2 බාහිර (බස්/ලොරි) | |
| | | | බස් | ලොරි |
| 1. නගර හෝටල් | ව.මී.300 ට එකක් | - | 2- බස් නැවතුම් | ලොරි නැවතුම් එකක් සේවා ප්‍රදේශ ආසන්නයේ |
| 2. තරු පන්ති හෝටල් | කාමර 5 ට එකක් සහ කාමර කට්ටල 2 කට එකක් | ඇඳ 04 කට 1 බැගින් | බස් නැවතුම් දෙකක් | ලොරි නැවතුම් දෙකක් සේවා ප්‍රදේශ ආසන්නයේ |
| ඒ) භෝජනාගාර | කාමර 5 ට එකක් | - | - | - |
| බී) සම්මන්ත්‍රණ ශාලා | කාමර 5 ට එකක් | - | - | - |
| සී) කාර්ය මණ්ඩල වාසස්ථාන | - | - | - | - |

*(සම්බන්ධිතයි)*

| භාවිතය | වාහන වර්ගය (සම්මත අවම වාහන නැවතුම්) | | | |
|---|---|---|---|---|
| | වාහන නැවතුම් | මෝටර් සයිකල්/පාපැදි | ඇකසල් 2 බාහිර (බස්/ලොරි) | |
| | | | බස් | ලොරි |
| i. විධායක කාර්ය මණ්ඩල | කාමර 2 ට එකක් | - | - | - |
| ii. අනෙකුත් කාර්ය මණ්ඩල | - | - | - | - |
| 3. අමුත්තන්ගේ නිවාස හා ලැගුම් හල | කාමර 5 ට එකක් | - | - | - |
| 4. ආපන ශාලා | ආසන 10 ට එකක් | ආසන 5 ට එකක් | - | - |
| 5. භෝජනාගාර | ආසන 10 ට එකක් | - | - | - |

පාඨලී චම්පික රණවක,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2017 සැප්තැම්බර් මස 01 වෙනි දින.

02 - 140/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.